Sinhalese: The Role of the Refugee Minor Program

# සිංහල: සරණාගත බාලවයස්කරුවන් පිළිබඳ වැඩසටහනේ කාර්යභාරය

සරණාගත බාල වයස්කරුවන් පිළිබඳ වැඩසටහනේ (Refugee Minor Program, (RMP)) කාර්යභාරය වන්නේ දෙමාපියන් නොමැති 'හුදකලාවූ මානුෂීය බාල වයස්කරුවන්' (Unaccompanied Humanitarian Minor, (UHM)) සේවා දායකයන් වික්ටෝරියාවේ පදිංචි කරවීමේ ක්‍රියාවලියට ආධාර කිරීම හා කලින් මැදිහත්වීම තුලින් හා රැක බලාගැනීම කරන පවුල්වලට සහයවීමට ප්‍රායෝගික පියවර ගැනීම මගින් රැක බලාගැනීමේ සැලසුම් බිඳවැටීම වළක්වාලීමයි.

RMP සහය වන්නේ:

**පහත දෑ වෙත යොමු කිරීමට හෝ සහය වීම ආදී පදිංචි කරවීමේ සේවා රැසක් සෘජුවම සැපයීමෙන්:**

- පවුල හා රැකබලාගැනීමේ සැලසුම් වලට ආධාර කිරීමෙන්
- සෞඛ්‍ය සේවා හා උපදේශන සඳහා ප්‍රවේශවීමට
- සෙන්ටර්ලින්ක් ගෙවීම් සාකච්ඡාවලට හා මුදල් පාලනය කරගැනීමට සහායවීම
- අධ්‍යාපන, පුහුණුවීම් සහ/හෝ රැකියා මාර්ග වලට සම්බන්ධ කිරීම
- රතු කුරුස වැනි අනාවරණ සේවයක් යොදවා ගැනීම තුලින් නැතිවූ ඥාතීන් සොයා ගැනීම හා සුදුසු නීති සේවා/ සංක්‍රමණ ඒජන්ත වරුන් UHM සමග සම්බන්ධවී ඥාතීන්ව ඕස්ට්‍රේලියාවේ නැවත පදිංචිකිරීමේ වීසා බලපත්‍ර සඳහා අනුග්‍රාහකත්වය සැපයීම. (සුදුසුනම්/හැකියාවක් ඇත්නම්)
- ක්‍රීඩා, විනෝදාත්මක, සංස්කෘතික, ආගමික හා සාමාජීය ක්‍රියාකාරකම් හා සම්බන්ධ කිරීම.

**සේවා දායකයන්ට ඕස්ට්‍රේලියාවේ පදිංචිවීම සඳහා අවශ්‍ය කුසළතා හා දැනුම වර්ධනය කර ගැනීමට සහාය වීමෙන්, පහත දෑ ඇතුළුව:**

- සරණාගත වීසා ස්වභාවය හා එහි අයිතිවාසිකම් තේරුම් ගැනීම
- ඕස්ට්‍රේලියාවේ සෞඛ්‍ය හා වෛද්‍ය පහසුකම් ක්‍රමය ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි තේරුම් ගැනීම
- සෙන්ටර්ලින්ක් හිමිකම් හා අනෙක් සමාජ සේවා ව්‍යුහයන් තේරුම් ගැනීම
- පොදු හා පුද්ගලික නිවාස හා ඉඳුම් හිටුම් සොයා ගන්නේ කෙසේදැයි තේරුම් ගැනීම
- නීති ක්‍රමය තේරුම් ගැනීම
- දුෂ්කරතාවයන් අත්විඳින සේවා දායකයන් වෙනුවෙන් අනෙකුත් සේවාවන් වෙත ඉල්ලීම් කිරීම

ආයාචනා කළමණාකරණය (case management) යනු කාර්යක්ෂම සැලසුම් කිරීම, සම්බන්ධීකරණය හා ආයාචනා කළමණාකරණ ක්‍රියාවලිය මඟින් තීරණය කරන ආකාරයට අනුව සේවා සැපයීමයි. මෙම  ක්‍රියාවලියට පවුල් විසින් තීරණ ගැනීමේ ආකෘතික ක්‍රියාවලිය (Family Decision Making, (FDM)) සහ ඉක්බිතිව රැකබලා ගැනීමේ කණ්ඩායම ස්ථාපනය කිරීම ඇතුලත් විය හැකිය. RMP සේවාවේ මෙම අදියරේ සිට මෙම ලියවිල්ලේ හතර වැනි පිටුවේ සඳහන් වික්ටෝරියාවේ '*ළමුන් පාදක ව්‍යුහයේ මූලික ප්‍රථිපල*' (*Key outcomes for children framework*) කෙරෙහිද අවධානය යොමු කළ යුතුය.

ආයාචනා කළමණාකරණය  අනෙකුත් සේවාවන්වල හා අනෙක් අංශවල වුවද 'ආයාචන භාර කළමනාකරුවන්ට' බලපෑමක් කිරීමද ඇතුලත් සම්බන්ධීකරණ කාර්යයක් විය හැකිය. මෙම අනෙක් ආයාචන භාර කළමනාකරුවන් ඔවුන්ගේ ආයාචනා කළමණාකරණ කාර්යයන් RMP ආයාචන භාර කළමනාකරුගේ කාර්යයට වඩා වෙනත් අන්දමකට නිර්වචනය කළ හැකිය. RMP ආයාචනා කළමණාකරණයට සාමාන්‍යයෙන් ඇතුලත් වන්නේ  ළමුන්, තරුණ අය හා රැකබලාගන්නන් සමඟ සෘජු සම්බන්ධතාවයකින් යුතු කාර්ය භාරයකි.

සියළුම RMP සේවා දායකයන්ගේ ආයාචනා කළමණාකරණය කිරීමේ වගකීම එක්කෝ දෙපාර්තමේන්තු සේවකයෙක්, හෝ ග්‍රාමීය සේවා දායකයන් වෙනුවෙන් නම් ගිවිසුම් කරගන්නා ලද ප්‍රජා සේවා සංවිධානය  මත පැවරේ.  ආයාචනා කළමණාකරණයට පහත දැක්වෙන කටයුතු අඩංගු විය හැක

- සේවා දායකයන් හඳුනාගැනීම හා ප්‍රජා සේවා සැපයීම
- පුද්ගලයා හා රැකබලාගන්නා තක්සේරු කිරීම හා ගැටළු  හඳුනා ගැනීම
- සේවා සැළසුම් කිරීම හා සම්පත් හඳුනාගැනීම
- සේවා දායකයන්ව අවශ්‍ය සේවා සමග සම්බන්ධ කිරීම
- සේවා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම
- සේවා ඉටුකිරීම අධීක්ෂණය කිරීම
- සේවා ලබාගැනීම වෙනුවන් කථාකිරීමට ඉදිරිපත්වීම
- සේවා පද්ධතියේ කාර්ය සාධනය ඇගයීම.

ආයාචනා සැළසුම (case plan) නිම කිරීම හා අධීක්ෂණය කිරීම සිදුවන්නේ මෙම අදියරේදීය;  නමුත්,ඕනෑම වේලාවක අවශ්‍ය පරිදි ආයාචනා සැළසුම සමාලෝචනය කිරීමට හා යම් වෙනසක් ඇති කිරීමට ඇති හැකියාව පිළිගැනීම වැදගත්වේ. යළි එකතු වීම, සෞඛ්‍යය හා අධ්‍යාපනය යන මූලික සුදුසුකම් ආයාචනා සැළසුමට පාදක වී ඇත. සේවා දායකයන් හා රැකබලාගන්න්ට ආධාර සැපයීම ඉතා තදින් අවධාරණය කරන අතර ඒකාබද්ධව මූලික සේවා සැපයීම පහසු කිරීම සඳහා ඒ හා බැඳුණු හොඳ අන්තර ආයතන යොමු කිරීම් හා සහයෝගිතා යාන්ත්‍රණයක් ඇත.

ආයාචනා සැළසුම් (case plan) සමාලෝචනය කිරීම අවම වශයෙන් වාර්ෂිකව හෝ නැතහොත් අවශ්‍ය ලෙස වඩා ක්‍රමවත්ව විය යුතුය. දැනට ආයාචනා සැළසුම් ක්‍රියා පටිපාටියක අඩු ලුහුඬුකම් පවතින බව RMP පිළිගන්නා අතර, අනාගතයේදී මේ අංශය පිළිබඳ වැඩිදුර කටයුතු කිරීමට RMP බැඳී සිටියි.  අනාගතයේදී යම් ආයාචනා සැළසුම් ක්‍රියා පටිපාටියක් සංවර්ධනය කිරීමේදී 'ළමුන් රැක බලාගැනීම' හා හොඳම සුභසිද්ධි සැළසුමේ ලේඛනගත සංකල්පයනට අනුකූලව සැළසුම් කිරීමට යෝජිතය. තවද,  අනාගතයේදී එවැනි යම් ක්‍රියා පටිපාටියක් සංවර්ධනය කළහොත් මෙම ලේඛනයේ උපග්‍රන්ථයක්හැටියට ඇතුලත්කරනු ඇත.